# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/6 - 2015 මාර්තු මස 16 වැනි සඳුදා - 2015.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(xii).

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27(1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය, කබීර් හෂීම් වන මම, මේ නියමය මගින්, අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ 1996 මර්තු මස 27 වන දිනැති අංක 916/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද කලින් කල සංශෝධිත නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එහි II වන උපලේඛනයේ I වන තීරයේ "පීඨය" යන ශීර්ෂය යටතේ සඳහන් "කලා සහ සංස්කෘතික පීඨය" යන සටහනට අනුරූප වන්නා වූ II වන තීරයේ "අධ්‍යයන අංශය" යන ශීර්ෂය යටතේ වූ ඇ. අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"ඇ. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය."

කබීර් හෂීම්,
මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2015 මාර්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

04 - 19


1A - PG 2400 — 505 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.